Department of Education,Sabaragamuwa Province/ Weekly School

විෂය - චිත්‍ර

සතිය- 3 සතිය

Prepared by- දෙහිඕවිට අධ්‍යාපන කලාපය

10 ශ්‍රේණිය

## කාර්යය පත්‍රිකාව

- ❖ ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යානය කරන්න.
- ❖ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✓ පෙරියතම්බි සුබ්‍රමුණියම් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- ✓ ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා හමුවන ස්ථාන නම් කරන්න.
- ✓ ඔහු විසින් නිර්මාණය කල නිර්මාණ සඳහා වස්තු විෂය වූයේ කුමක් ද/
- ✓ පෙරිය සුබ්‍රමුණියම් තම නිර්මාණ සඳහා ආභාෂය ලබාගත් ඉන්දියානු චිත්‍ර ශිල්පියා කවු ද?
- ✓ පෙරිය සුබ්‍රමුණියම් කෝවිල් චිත්‍රවලට අමතරව කළ වෙනත් නිර්මාණ මොනවා ද?

- පහත දැක්වෙන්නේ පෙරිය සුබ්‍රමුණියම් විසින් නිර්මාණය කළ අගස්තියර් විනායගර් නම් සිතුවමයි එය උපයෝගී කර ගනිමින් දී ඇති උප මාතෘකාවලට අදාළව **අර්ථවත් වාක්‍ය 5** ක් ලියන්න.



I. දක්නට ඇති ස්ථානය
II. ශිල්ප ක්‍රමය
III. වර්ණ භාවිතය
IV. සංරචනය කර ඇති අයුරු
V. සිද්ධාන්ත භාවිතය

# කියවීම් පත්‍රිකාව

## පෙරිය තම්බිසුබ්‍රමුණියම් ශිල්පියාගේ නිර්මාණ අගයමු

1920 .09.21 දින යාපනය නල්ලූර්වල උපත ලබමින් 2006.03.15 දින අප අතරින් සමුගත් දමිල ජාතික පෙරියතම්බි සුබ්‍රමුණියම් මහතා විශිෂ්ඨ චිත්‍ර ශිල්පියෙකි. ඔහු ස්ව උත්සාහයෙන්ම චිත්‍ර කලාව හැදෑරූ ශිල්පියෙකි. ඉන්දියනු කලා කරු රවි වර්මාගේ පුරාණ ඓතිහාසික සිද්ධි නිරූපිත සිතුවම් වල සශලීය ලක්ෂණ හා දෘෂ්ඨී මයා ප්‍රකාශන ශිල්ප ක්‍රමය පෙරිය තම්බිගේ සිතුවම් සඳහා ද ආභාසය ලබා ඇත. පෙරියතම්බි සුබ්‍රමුණියම් ඔහුගේ නිර්මාණ ඓතිහාසික සිද්ධීන් උපයෝගී කරගන නිර්මාණය කර ඇත.

නල්ලූර් කෛලාස පිල්ලෙයාර් කෝවිල,ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල, සුදුමලෙයි අම්මාන් කෝවිල, වැල්වැටිතුරෙයි සිවන් කෝවිල, නල්ලූර් වීර අම්මාන් කෝවිල,වේලනේ අම්මාන් කෝවිල ආදී කෝවිල් බිත්ති මත සහ තිර රෙදිවල මොහු විසින් නිර්මාණය කල සිතුවම් දක්නට ඇත. ඔහුගේ සිතුවම් අතර ඉනුවෙල් පරරාසසේකරන් කෝවිලේ දක්නට ඇති අගස්තියර් හා විනයගර් නම් සිතුතවම සහ ඉනුවෙල් පරරාසසේකර පිල්ලයර් කෝවිලේ දක්නට ඇති ඇතා වල්ලිව එලවාගන යාම සිතුවම් සුවිශේෂී නිර්මාණ වේ .මේවා හුණු බිත්තිය මත තලය සකස් කිරීමකින් තොරව එනමල් වර්ණ යොදා නිර්මාණය කර ඇත. ස්වාභාවික ප්‍රමාණයට නිර්මාණයකර ඇති මෙම සිතුවම් ඉතා ආකර්ශනීය ලෙස භාවිතා කර ඇති වර්ණ,විවිධ තානයන් (වර්ණ ප්‍රභේද ) යොදා ගනිමින් ත්‍රිමාණ ලක්ෂණ මතුවන සේ ඇඳ ඇති අතර පර්යාවලෝකන ලක්ෂණ ද හොඳින් දක්වා ඇත. සිතුවම් වල හැඟීම් ප්‍රකාශනය ඉතා විශිෂ්ඨය. කෝවිල් බිත්තිවලට අමතරව ඔහු විශාල ප්‍රමාණයේ බැනර් හා කටවුට් චිත්‍ර නිර්මාණය කිරීම සඳහා දායක වූ ශිල්පියෙක් ද වේ.